ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය: PS/EAD/Circular/16/2022

මගේ අංකය: PS/EAD/08/23

2023 ජනවාරි මස 09 වන දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු
පළාත් ප්‍රධාන ලේකම්වරු
පළාත් ආණ්ඩුකාර ලේකම්වරු වෙත

විදෙස් රාජ්‍ය, ජාත්‍යන්තර සංවිධාන, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ රජයේ අමාත්‍යාංශ/ ආයතන පවත්වනු ලබන අන්තර් ක්‍රියා

ජනාධිපති ලේකම්ගේ අංක SP/CA/01/11 දරන 2011 ජනවාරි 14 දිනැති චක්‍රලේඛය සංශෝධනය කරමින් නිකුත් කරනු ලබන මෙම චක්‍රලේඛය 2022 දෙසැම්බර් මස 23 වන දින සිට බලාත්මක වේ.

විදෙස් රාජ්‍ය, ජාත්‍යන්තර සංවිධාන, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ අන්තර් ක්‍රියා පැවැත්වීමේ දී රජයේ ආයතන විසින් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ මෙම චක්‍රලේඛයෙහි අන්තර්ගත ය. ශ්‍රී ලංකා රාජ්‍යයේ විවිධ ආයතන (උදා. අමාත්‍යාංශ, පළාත් සභා, දෙපාර්තමේන්තු) සහ විදෙස් රජයන්, ආයතන සහ ඔවුන්ගේ රාජ්‍යතාන්ත්‍රික නියෝජනයන් අතර පවත්නා විධිමත් හා කාර්යපාදක සබඳතා විධිමත් කිරීම සහ ක්‍රමානුකූලව සකස් කිරීම මෙමගින් සිදු කෙරෙනු ඇත.

පහත සඳහන් මාර්ගෝපදේශයන්ට දැඩිව අනුගත විය යුතු බව ගරු ජනාධිපතිතුමා විසින් නියම කර ඇත. එබැවින්, මෙම චක්‍රලේඛයෙහි සඳහන් අන්තර්ගතය ඔබගේ ගරු අමාත්‍යවරයාගේ/ ගරු නියෝජ්‍ය අමාත්‍යවරයාගේ/ ගරු ආණ්ඩුකාරවරයාගේ/ ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ සහ ඔබ යටතේ ක්‍රියාත්මක වන අමාත්‍යාංශයේ/ පළාත් සභාවේ/ දෙපාර්තමේන්තුවේ සහ ආයතනයන්හි නිලධාරීන්ගේ අවධානයට යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

1. <u>සාමාන්‍ය</u>

1961 ජාත්‍යන්තර සබඳතා පිළිබඳ වියානා සම්මුතියේ 41(2) වගන්තියට සහ ජාත්‍යන්තරව පිළිගත් පරිචයන්ට අනුකූලව ජාත්‍යන්තර සබඳතා ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රධාන ආයතනය වන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශය යි. මෙය, ජාත්‍යන්තර සබඳතා පැවැත්වීමේ දී, රාජ්‍යයේ විවිධ අස්ථිත්ව සමගාමී සම්බන්ධීකරණයෙන් ක්‍රියා කරන බව තහවුරු කිරීම සඳහා වේ.

2. <u>ශ්‍රී ලංකා රජය සහ විදෙස් රජයන්/ අස්ථිත්ව අතර සන්නිවේදන මාධ්‍යය</u>

2.1 විදෙස් රජයන් සහ අස්ථිත්ව සමඟ සිදු කරනු ලබන සියලුම සන්නිවේදන, මූලික වශයෙන්, පහත සඳහන් කරුණුවලට යටත්ව විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් යොමු කළ යුතු ය:

2.1.1 ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විදෙස් රජයන් සමඟ පවත්වනු ලබන සාකච්ඡා හෝ ප්‍රතිපත්තිමය ගැටලු හා සම්බන්ධ වන සියලුම සන්නිවේදන මෙන්ම එම ආකාරයේ සන්නිවේදන නොවන නමුත් ඒ දක්වා වර්ධනය විය හැකි සන්නිවේදන විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා පමණක් සිදු කළ යුතු ය.

2.1.2 ශ්‍රී ලංකාවේ දේශීය වශයෙන් දූත මණ්ඩලයක් පිහිටුවා නොමැති හෝ වෙනත් රටක පිහිටි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩලයක් මගින් නියෝජනය නොකරනු ලබන විදෙස් රජයක් සමඟ කිසිදු ආකාරයක සන්නිවේදනයක් විදේශ කටයුතු අමාත්‍යාංශය හැර වෙනත් කිසිදු රාජ්‍ය ආයතනයක් මගින් සෘජුව ඉදිරිපත් නොකළ යුතු ය.

Galle Face, Colombo 01 | Telephones ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873 | Fax ++ 94 11 2446657 | e-mail prsec@presidentsoffice.lk

මෙම රාජ්‍ය පරිපාලන/රාජ්‍ය............................ ....වලංගු දිනය / ලිපිය .... දින සිට දකුණු ... ගරු ... දින ... ආණ්ඩුකාර ...

2.1.3 ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදෙස් රජයන්, දූත මණ්ඩල, කලාපීය සහ ජාත්‍යන්තර සංවිධානවල නේවාසික නියෝජිතයන් සහ අනෙකුත් සියලුම රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සමඟ සිදු කරනු ලබන ලිපි ගනුදෙනු, රාජ්‍යතාන්ත්‍රික පරිචයට අනුකූලව, විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් සිදු කළ යුතු ය. විදේශ කටයුතු අමාත්‍යාංශයට, එවැනි ලිපි ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ ආයතන සඳහා අවශ්‍ය උපදෙස් හෝ යෝජනා ලබා දීම සිදු කළ හැකි ය.

2.1.4 නගර සභා ඇතුළුව පළාත් සභා සහ පළාත් පාලන අධිකාරි විසින් විදෙස් රජයන්/ ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සමඟ සෘජුව තොරතුරු හුවමාරු කර ගැනීම හෝ ලිපි ගනුදෙනු කිරීම සිදු නොකළ යුතු ය.

2.1.5 විශේෂ විධි ක්‍රියා සහ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන, ආරක්ෂාව සහ විදේශ අරමුදල් ආදි විශේෂ ක්ෂේත්‍රයන්හි දී රේඛීය අමාත්‍යාංශ/ ආයතන සහ ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සහ අදාළ අස්ථිත්ව අතර මෙන්ම එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ පහත අවස්ථාවන්හිදී සෘජු අන්තර් ක්‍රියා පැවැත්වීම යෝග්‍ය වනු ඇත. කෙසේවුවත්, මෙම සියලු අන්තර් ක්‍රියා, විශේෂයෙන්, විදේශ ප්‍රතිපත්ති පිළිබඳ දෘෂ්ටිකෝණයෙන් සලකා බැලීම අවශ්‍ය වන්නා වූ ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්වලට අදාළ කරුණු පිළිබඳ විදේශ කටයුතු අමාත්‍යාංශය දැනුවත් කළ යුතු වේ:

(අ) මුදල් අමාත්‍යාංශය විසින් දේශපාලනික/ මූලෝපායික බලපෑමක් සහිත ප්‍රධාන ප්‍රතිපත්තිමය ගැටලු විදේශ කටයුතු අමාත්‍යාංශය විමසා සිදු කළ යුතු බවට වන පදනම මත පහත කරුණු සම්බන්ධයෙන් අදාළ විදෙස් රජයන්/ ජාත්‍යන්තර සංවිධාන සමඟ සෘජුව සම්බන්ධ විය හැකිය:

- ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අන්තර්ජාතික සංවර්ධන සංගමය, ආසියානු සංවර්ධන බැංකුව, අප්‍රිකානු සංවර්ධන බැංකු සමූහය ආදි බහුපාර්ශ්වීය/ ප්‍රාදේශීය මූල්‍ය ආයතනවලින් ණය පහසුකම් ලබා ගැනීමට සාකච්ඡා පැවැත්වීම;
- අසල්වැසි රටවල් සඳහා සහාය ලබා දීම වෙනුවෙන් වූ යෝජනා සම්බන්ධයෙන් හැර ණය සහ ප්‍රදාන ආකාරයෙන් ද්විපාර්ශ්වීය සහයෝගිතා සහාය ලබා දීම; අනෙකුත් රටවල් සඳහා සහයෝගිතා සහාය ලබා දීමේ මූලික ක්‍රියාවලිය ද විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් හෝ එම අමාත්‍යාංශය විමසා සිදු කළ යුතු ය;
- විදේශ වානිජ ණය ගැනීම්/ විදේශ ණය සම්බන්ධ කරුණු;
- දේශපාලනික අරමුණු නොමැතිව විදේශ මූල්‍ය බෙදී යාම පිළිබඳ හුදු ආර්ථික ගැටලු; සහ
- විදේශ විනිමය සම්පත් කළමනාකරණය
- මෙම තාක්ෂණික කරුණු පිළිබඳ සාකච්ඡා සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය නිරන්තරයෙන් දැනුවත් කළ යුතු ය.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයට, විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව ඇතිව ප්‍රධාන/ප්‍රමුඛ ගැටලු සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කිරීමෙන් අනතුරුව පමණක් තාක්ෂණික සහ ප්‍රවර්ධන තොරතුරු සම්බන්ධයෙන් විදෙස් රජයන්/ ශ්‍රී ලංකාවේ පිහිටි ඔවුන්ගේ දූත මණ්ඩල සමඟ ලිපි ගනුදෙනු කිරීම සිදු කළ හැකි ය. මෙම තාක්ෂණික කරුණු පිළිබඳ සාකච්ඡා සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය නිරන්තරයෙන් දැනුවත් කළ යුතු ය.

2.1.6 විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සහයෝගීත්වයෙන් දැනටමත් සමථයකට පත්ව ඇති තාක්ෂණික සහයෝගිතාව, ආධාර සහ සහාය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පිහිටි අදාළ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනය සමඟ සෘජුව ලිපි ගනුදෙනු කිරීම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් අඛණ්ඩව සිදු කරනු ඇත. කෙසේවුවත්, අංශ අතර හෝ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන අතර පවතින අනුමිතීන් අඩංගු නව ප්‍රතිපත්ති අභිලාෂ පියවරවලට සම්බන්ධ වන්නා වූ කුමන හෝ කරුණක් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් අනුමත කළ යුතු ය. රේඛීය ආයතන විසින් කාන්තාවන්, ළමුන්, ආහාර සුරක්ෂිතතාව, දේශගුණික විපර්යාස යනාදී විෂයයන් පිළිබඳව, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනෙකුත් අන්තර්-රාජ්‍ය මූලාරම්භයන් සමඟ සම්බන්ධීකරණයෙන් සකස් කරන ලද ප්‍රකාශන/වාර්තා සඳහාද මෙම ක්‍රියාපටිපාටිය භාවිත කළ යුතුය. විශේෂයෙන්ම එවැනි

2023. 03. 13

ප්‍රකාශන/වාර්තා සකස් කිරීමේ උපදේශන ක්‍රියාවලියට විදේශ කටයුතු අමාත්‍යාංශය ඇතුළත් විය යුතුය.

2.1.7 සාකච්ඡා හෝ ප්‍රතිපත්තිමය ගැටලුවලට අදාළ නොවන ආකාරික හෝ තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් වන නිල නොවන ලිපි ගනුදෙනු හෝ සාකච්ඡා වෙනත් අමාත්‍යාංශ විසින් ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩලයන්හි නියෝජිතයන් සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සෘජුව සිදු කළ යුතු ය. එලෙස සිදු කරනු ලබන නිල නොවන සන්නිවේදනයන්හි පිටපත් විදේශ කටයුතු අමාත්‍යාංශයට යොමු කළ යුතු ද යන්න අමාත්‍යාංශ විසින් තීරණය කළ යුතු වේ.

2.1.8 ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩල වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නිලධාරියෙකු හා සම්බන්ධ වන්නේ නම් හා සම්බන්ධ වන අවස්ථාවේ දී, එය ආකාරික කරුණක් වශයෙන් ආරම්භයේ දී දැකිය හැකි වුවද, පසුව වඩාත් වැදගත් කරුණක් දක්වා වර්ධනය විය හැකි නම්, එම කරුණ පිළිබඳ විදේශ කටයුතු අමාත්‍යාංශය හැකි ඉක්මනින් දැනුවත් කළ යුතු ය.

2.1.9 යම් විෂයයක් සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මූලික විධිවිධාන සලසා දීමෙන් අනතුරුව, එම විෂය සම්බන්ධයෙන් විවිධ අමාත්‍යාංශ/ නියෝජිතායතනවල තාක්ෂණික නිලධාරීන් සහ ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල හෝ ජාත්‍යන්තර/රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් අතර තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් සිදු කරන සෘජු ලිපි ගනුදෙනු සඳහා අවසර ඇත. කෙසේ වෙතත්, එවැනි සියලු සන්නිවේදනයන් පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශය දැනුවත් කළ යුතුය.

2.1.10 කොළඹ පිහිටි දූත මණ්ඩලයක් විසින් නිශ්චිත හදිසි අවස්ථාවන්හි දී සහ විශේෂ අවශ්‍යතාවයන් ඇති වී තිබෙන විට රේඛීය අමාත්‍යාංශයක්/ දෙපාර්තමේන්තුවක්/ රජයේ නියෝජිතායතනයක්, සම්බන්ධ කර ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශයට පිටපතක් ද සහිතව විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඉල්ලීම යොමු කළ යුතු බවට විදේශ දූත මණ්ඩලවලට උපදෙස් ලබා දී ඇත. ශ්‍රී ලංකා රජයේ අදාළ ආයතනය, දූත මණ්ඩලයක් විසින් යොමු කරනු ලබන එවැනි ඉල්ලීමක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී, එකී ක්‍රියාවලිය අනුගමනය කර ඇති ද යන්න තහවුරු කරගත යුතු ය.

2.2 ඉහත සඳහන් ක්‍රමවේදයට අනුගත වීම වැදගත් වන්නේ, පෙර බොහෝ අවස්ථාවන්හි දී ඇති වූ අවුල්සහගත තත්ත්වවලදී, මුඛ්‍ය ගැටලු සමථයකට පත් කිරීම සඳහා අදාළ ජාතික නියෝජිතායතනය සහ විදෙස් රජය අතර අතරමැදියා වශයෙන් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සහාය වීම අවශ්‍ය වූ බැවිනි. එවැනි ගැටලු, නොවිසඳනු ලැබුවහොත් හෝ ක්‍රමයෙන් වැඩි වීමට ඉඩ සැලසුවහොත්, ශ්‍රී ලංකාව සහ අදාළ විදෙස් රාජ්‍ය හෝ සංවිධානය අතර පවතින සමස්ථ ද්විපාර්ශ්වීය සබඳතාව කෙරෙහි අහිතකර ලෙස බලපෑම් සිදු කරනු ලබන හේතූන් හෝ අන්තර් රාජ්‍ය මතභේද බවට පත්විය හැකි ය. එවැනි අවස්ථා දිගින් දිගටම පැවතීම, අදාළ විදෙස් රජය හෝ අස්ථිත්වය විසින් ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍යයෙන් වැදගත් ක්ෂේත්‍රයක් තුළ, අහිතකර ලෙස ප්‍රතික්‍රියා ගන්නා බවට තර්ජනය කිරීමට හෝ එසේ ක්‍රියා කිරීම දක්වා මඟ පැදිය හැකි ය.

3. <u>විදෙස් රජයන්හි අමාත්‍යවරු, තානාපතිවරු හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ පවත්වනු ලබන රැස්වීම්</u>

අමාත්‍යවරු/ රේඛීය නියෝජිතායතන සහ ශ්‍රී ලංකා රජය යටතේ රජයේ තනතුරු දරන නිලධාරීන් මෙරටට පැමිණෙන අමාත්‍යවරු, ප්‍රභූන්, දූත මණ්ඩල, තානාපතිවරු හෝ විදේශ රටවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවීමේ දී විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ අනෙකුත් අදාළ අමාත්‍යාංශවල නියෝජිතයෙකුට ආරාධනා කළ යුතු ය. මෙම අවශ්‍යතාවය ඉටු නොවන අවස්ථාවේ දී, අදාළ නියෝජිතායතනය විසින් අවම වශයෙන්, රැස්වීම් සාකච්ඡාවේ සාරාංශ වාර්තාවක් විදේශ කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතු ය.

විදෙස් ආරාධිත අමුත්තන් සමඟ පවත්වනු ලබන සාකච්ඡාවේ තත්ත්වය සහ සුවිශේෂතාව මත පදනම්ව අදාළ රජයේ ආයතන විසින් එම සාකච්ඡාවන්හි දී ඉදිරිපත් කළ යුතු කරුණු සහ අදාළ තොරතුරු සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගත යුතු ය.

4. <u>ශ්‍රී ලංකා රජය විසින් පිළිගෙන නොමැති හෝ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කර නොමැති රාජ්‍ය/ රජයන් සමඟ කටයුතු කිරීම</u>

ශ්‍රී ලංකා රජය විසින් පිළි නොගත් හෝ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිටුවා නොමැති රාජ්‍යන්හි/ රජයන්හි නියෝජිතයන් විසින් සංවිධානය කරන ලද උත්සව සඳහා ශ්‍රී ලංකා රජයේ ප්‍රභූන්/ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගීව සිටි අවස්ථා මෑත කාලයේ දී නිරීක්ෂණය විය. මෙම තත්ත්වය, සැලකිය යුතු අන්දමේ ද්විපාර්ශ්වීය සහ බහුපාර්ශ්වීය ගැටලු ඇති කරනු ලැබ ඇත. මෙවැනි අවස්ථා වැළැක්වීම සඳහා කිසිදු රජයේ ආයතනයක් විසින් එවැනි නියෝජනයන් විසින් පවත්වනු ලබන උත්සව අවස්ථා සහ කටයුතු සඳහා ආරාධනා පිළිගැනීම/ පිළිගැන්වීම සිදු නොකල යුතුය. මේ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම්, විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් විමසීම් සිදු කළ හැකි ය.

විමසීම්: සන්ධාන අංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය
දුරකථන: 0112 421816/ 011 2327048
විද්‍යුත් තැපැල: <u>cprot@mfa.gov.lk</u>, <u>protocol@mfa.gov.lk</u>

5. <u>විදේශ සබඳතා පිළිබඳ මාධ්‍ය ප්‍රකාශන</u>

අමාත්‍යාංශ/ නියෝජිතායතන විසින් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සහ සබඳතා, විදෙස් රටවල් සම්බන්ධ ගැටලු, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල ආදිය සම්බන්ධයෙන් කිසිදු ආකාරයක මාධ්‍ය ප්‍රකාශනයක් (සම්මුඛ සාකච්ඡා, සමාජ මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය, ඩිජිටල්/ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය ආශ්‍රිත ලිපි) විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලිඛිත නිෂ්කාශනයක් නොමැතිව නිකුත් නොකළ යුතු අතර එය, අයුතු ද්විපාර්ශ්වීය හෝ බහුපාර්ශ්වීය සංවර්ධනයන් වැළැක්වීමටත්, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සංගත ප්‍රවේශයක් විදීමත් කිරීමටත් ඉවහල් වේ.

මෙවැනි මාධ්‍ය ප්‍රකාශන සිදු කිරීමේ දී ගරු අමාත්‍යවරු, ගරු රාජ්‍ය/ නියෝජ්‍ය අමාත්‍යවරු, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තම උපරිම අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ..

විමසීම්: මහජන රාජ්‍යතාන්ත්‍රික අංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය
දුරකථන: 0112 437633
විද්‍යුත් තැපැල: <u>publicity@mfa.gov.lk</u>

6. <u>ජාත්‍යන්තර ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්</u>

(අ) ද්විපාර්ශ්වීය, කලාපීය සහ බහුපාර්ශ්වීය ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ සාකච්ඡා පැවැත්වීම සහ ඒ සම්බන්ධයෙන් විදෙස් අස්ථිත්ව සමඟ ගිවිසුම්වලට එළැඹීම

(i) 2002 අගෝස්තු 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ශ්‍රී ලංකා රජයේ රේඛීය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් විදෙස් රාජ්‍යවල අධිකාරයන් සමඟ ගිවිසුම් සම්බන්ධයෙන් සිදු කරනු ලබන සාකච්ඡාවලට අදාළ යම් විධිමත් යෝජනා, <u>ප්‍රථමයෙන්</u>, විදේශ කටයුතු අමාත්‍යාංශයේ අවධානයට යොමු කළ යුතු ය.

විදේශ අස්ථිත්ව සමඟ ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්වලට එළැඹීමේ දී, එවැනි නෛතික ලේඛන සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් නිෂ්කාශන ලබා ගැනීම අනිවාර්ය වන අතර එහිදී විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් විදේශ සබඳතාවලට අදාළව ප්‍රතිපත්තිමය සහ නෛතික දෘෂ්ටිකෝණයෙන් සංවේදිතා සහ ගම්‍යාර්ථ පවතී ද යනාදි කරුණු පරීක්ෂා

කරනු ලැබේ. රේඛීය අමාත්‍යාංශ/ නියෝජිතායතන සෘජුවම නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වන ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් හැර, ගරු නීතිපතිතුමාගේ අදහස් විමසිය යුතු නෛතික ගම්‍යාර්ථ පවතී නම්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය මත එවැනි ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් රේඛීය අමාත්‍යාංශය විසින් ගරු නීතිපති වෙත යොමු කළ යුතු ය.

විදෙස් මූල්‍යකරණය, ණය ගැනීමේ වැඩපිළිවෙළ, ණය පහසුකම් ලබා ගැනීම සහ එම ආකාරයේ අනෙකුත් ලේඛන සඳහා වගකිව යුතු මුදල් අමාත්‍යාංශය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ගරු නීතිපතිතුමාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ අදාළ මාර්ගෝපදේශයන්ට සහ නිෂ්කාශනයන්ට යටත්ව කටයුතුවල නිරත වනු ඇත. එවැනි කටයුතු සහ කිසියම් ලේඛනයක් සම්බන්ධයෙන් වූ නිගමන විදේශ කටයුතු අමාත්‍යාංශයට දැන්විය යුතු ය.

(ii) විවිධ මූල්‍ය වැඩසටහන් සාකච්ඡා කිරීම, ණය ගැනීම් විධිවිධාන, ණය ආධාර සහ වෙනත් සමාන ආකාරයේ උපකරණ පිළිබඳව ආයෝජකයින්, ණය දෙන ආයතන, විදේශීය සංවිධාන සහ දූත මණ්ඩල සමඟ සාකච්ඡා කිරීමට අදාළ චක්‍රලේඛයක් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කිරීමට නියමිතය.

(iii) පළාත් සභා, පළාත් අමාත්‍යවරු සහ විදෙස් රජයන් සමඟ එළඹෙන ගිවිසුම් පිළිබඳ නිගමන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ, විදේශ රටවල් සමඟ සන්ධාන, ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් සහ සම්මුතිවලට එළැඹීම සහ ක්‍රියාත්මක කිරීම යන විෂය සංචෘත ලැයිස්තුවෙහි අන්තර්ගත වන අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44වන ව්‍යවස්ථාව යටතේ විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත පවරා ඇත.

ගරු ආණ්ඩුකාරවරු/ ගරු ප්‍රධාන අමාත්‍යවරු/ ගරු පළාත් සභා අමාත්‍යවරු නිල විදෙස් සංචාරයන්හි නිරත වීමේ දී, විදේශ කටයුතු අමාත්‍යාංශයේ පූර්ව උපදෙස් නොමැතිව විදෙස් රටවල ප්‍රාදේශීය අස්ථිත්ව සමඟ නෛතික ලේඛන, අවබෝධතා ගිවිසුම් පිළිබඳව හෝ තීරණය නොකළ යුතු ය.

පවතින ව්‍යවස්ථාමය අවශ්‍යතා සැලකීමේ දී, අනෙකුත් කරුණු අතුරින් විදේශ සබඳතාවලට අදාළව ප්‍රතිපත්තිමය සහ නෛතික දෘෂ්ටිකෝණයෙන් සංවේදිතා සහ ගම්‍යාර්ථ පවතී ද යනාදී පරීක්ෂා කරනු ලබන විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් එවැනි ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් නිෂ්කාශන ආරම්භයේ දී ම ලබා ගැනීම අනිවාර්ය වේ. ගරු නීතිපතිතුමාගේ අදහස් විමසිය යුතු නෛතික ගම්‍යාර්ථ පවතී නම්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය මත එලෙස එළැඹීමට අපේක්ෂිත නෛතික ලේඛන පිළිබඳ අදාළ පළාත් සභාවේ රේඛීය අමාත්‍යාංශය විසින් ගරු නීතිපති වෙත යොමු කළ යුතු ය.

අදාළ පළාත් සභාව, ඉන් අනතුරුව, විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව මත ඉදිරි කටයුතු සිදු කළ යුතු ය.

(iv) ආධාර හෝ විදේශ ණය ආකාරයෙන් විදෙස් ආයෝජන යෝජනා, රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සම්බන්ධයෙන් මූල්‍යකරණ යෝජනා හෝ ද්විපාර්ශ්වීය හෝ බහුපාර්ශ්වීය වශයෙන් මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා කටයුතු කිරීමේ දී මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමතිය ලබා ගත යුතු ය. එවැනි ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළැඹීමට පෙර අමාත්‍ය මණ්ඩලයේ සහ ගරු නීතිපතිතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ. එවැනි නෛතික ලේඛන/ රාමු අත්සන් කිරීමෙන් අනතුරුව ගිවිසුම් දර්ශකය (Treaty Index) යාවත්කාලීන කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ අවධානයට යොමු කළ යුතු ය.

(ආ) අමාත්‍ය මණ්ඩල අනුමැතිය

ගිවිසුමක අන්තර්ගතය ස්ථාපිත වූ පසු, රජය ඊට බැඳීම සඳහා ක්‍රියා කිරීමට පෙර අදාළ රේඛීය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, රේඛීය අමාත්‍යාංශය/ ආයතනය සමඟ

මෙම රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය .... චක්‍රලේඛය / උපදෙස්
ලිපිය ....
දින ....
ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් / පරිනි.

එක්ව විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් පූර්ණ බලතල ප්‍රදානය කෙරෙන පාඨය සකස් කිරීමට කටයුතු කරනු ඇති අතර, එමගින් රජය වෙනුවෙන් අත්සන් තැබීම සඳහා පුද්ගලයෙකු නම් කරනු ලැබේ. 'ගිවිසුම', 'අවබෝධතා ගිවිසුම', සන්ධානය ආදි කුමන නාමයෙන් සඳහන් වුව ද පවතින සෑම ලේඛනයක් සඳහාම මෙම කරුණ අදාළ වේ.

(ඇ) පූර්ණ බලතල

කිසිදු පුද්ගලයකුගේ ලිඛිත අධිකාරය නොමැතිව, රාජ්‍යයේ හෝ රජයේ ප්‍රධානීට සහ විදේශ කටයුතු අමාත්‍යවරයාට පමණක් කිසියම් ජාත්‍යන්තර බැඳියාවක් සඳහා රජය බැඳිය හැකි ය. ජාත්‍යන්තර ගිවිසුම් අත්සන් කිරීමට පෙර අනෙකුත් සියලුම පුද්ගලයන් සඳහා විදේශ කටයුතු අමාත්‍යවරයාගේ ලිඛිත අධිකාරය (පූර්ණ බලතල) අවශ්‍ය වේ. එබැවින්, අදාළ රේඛීය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය විසින් පූර්ණ බලතල පිළිබඳ සඳහන් ලේඛනය විදේශ කටයුතු අමාත්‍යවරයාගේ අත්සනට යොමු කිරීම සඳහා සකස් කිරීමට හැකි වන පරිදි, අත්සන් කරනු ලබන දිනට පෙර (අවම වශයෙන් සති දෙකක්) අමාත්‍ය මණ්ඩල අනුමැතියේ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) අක්තපත්‍ර

බහුපාර්ශ්වීය ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කරන අවස්ථාවේ දී සහ බහුපාර්ශ්වීය සංසදවලට සහභාගි වීමේ දී, රජයේ නියෝජිතයන් නම් කරනු ලබන මෙන්ම ඔවුන්ගේ අධිකාරය පිළිබඳ විෂය ක්ෂේත්‍රය නියම කරනු ලබන අක්තපත්‍ර අවශ්‍ය වේ. අමාත්‍යවරයෙකු විසින් දූත මණ්ඩලය මෙහෙයවනු ලබන අවස්ථාවේ දී, අතිගරු ජනාධිපතිතුමා විසින් දූත මණ්ඩලය අනුමත කළ විට, විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් එවැනි අක්තපත්‍ර බලාත්මක කරනු ඇත. නිල මට්ටමේ දූත මණ්ඩලයක් සම්බන්ධයෙන් වනවිට, අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් දූත මණ්ඩලය අනුමත කිරීමෙන් අනතුරුව, අක්තපත්‍ර පිළියෙළ කරනු ලැබේ. අක්තපත්‍ර සඳහා සිදු කරනු ලබන ඉල්ලීම්, එවැනි අනුමැතියක පිටපතක් ද සහිතව විදේශ කටයුතු අමාත්‍යවරයාගේ අත්සනට යොමු කිරීම සඳහා එම අක්තපත්‍ර සැකසීමට හැකි වන පරිදි, අත්සන් කරනු ලබන දිනට පූර්වයෙන් (අවම වශයෙන් සති දෙකක්) ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) පාර්ලිමේන්තු අනුමැතිය

ශ්‍රී ලංකාව විසින් අනුගමනය කරනු ලබන පරිචයට අනුකූලව, ජාත්‍යන්තර ගිවිසුම් සම්බන්ධයෙන් ගිවිස ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පමණක් අවශ්‍ය කෙරේ. කෙසේවුවද, සාමාන්‍යයෙන්, ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් පාර්ලිමේන්තුවට සභාගත කළ යුතු අවස්ථා හතරක් වේ. එනම්;

(i) පාර්ලිමේන්තු පනතක් සඳහා විශේෂයෙන්, පාර්ලිමේන්තු අනුමැතිය අවශ්‍ය වන අවස්ථාවේ දී. උදාහරණයක් වශයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වන ව්‍යවස්ථාව ප්‍රකාරව, එකී ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාපිත ආරක්ෂාව සහතික කිරීම සඳහා ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත් යම් ගිවිසුමක් පාර්ලිමේන්තු අනුමැතිය සඳහා සභාගත කිරීම අවශ්‍ය වේ.

(ii) ද්විත්ව බදු ගිවිසුම් උදර්පනය සහ වැළැක්වීම.

(iii) දේශීය වශයෙන් ගිවිසුම් බලාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාදායකය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වන අවස්ථාවේ දී.

(iv) සම්මුතියේ විෂය කරුණ අධිගාමික දේශපාලනික වැදගත්කමක් ඇති අවස්ථාවේ දී, එය පාර්ලිමේන්තුවේ දැනගැනීම සඳහා සභාගත කළ යුතු ය.

එවැනි අවස්ථාවන්හි දී, අදාළ ගිවිසුම පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශය සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු ය.

මෙම රාජ්‍ය පරිපාලන/රාජ්‍ය ... චක්‍රලේඛය / උපදෙස් ... දින සිට ... 2023.03.13

(ඊ) සුරක්ෂිතාගාර කටයුතු

ශ්‍රී ලංකාව විසින් එළැඹි ජාත්‍යන්තර ගිවිසුම් තැන්පත් කරනු ලබන සුරක්ෂිතාගාරය වන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශය යි. එබැවින්, ශ්‍රී ලංකාව වෙනුවෙන් අත්සන් කරන ලද ඕනෑම ගිවිසුමක මුල් පිටපත විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශයේ තැන්පත් කිරීම සඳහා එම අමාත්‍යාංශයට යොමු කළ යුතු ය. අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවේ දී, වැදගත් ගිවිසුම් ශ්‍රී ලංකා සම්මුති මාලාවේ (Treaty Series) ප්‍රකාශයට පත් කරනු ඇත.

විමසීම්: නීති අංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය
විද්‍යුත් තැපැල: legal@mfa.gov.lk

7. විදෙස් සංචාර

විදේශ ගතවන ශ්‍රී ලංකාවේ අමාත්‍යවරුන් සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා විදේශීය ප්‍රභූවරුන් සමඟ නිල හමුවීම් සංවිධානය කරන ලෙස අවස්ථා කිහිපයකදීම විදේශ කටයුතු අමාත්‍යාංශයට ඉතා කෙටි දැනුම්දීමකින් ඉල්ලීම් කර ඇත. එක් විදේශීය අගනුවරකට ශ්‍රී ලංකාවෙන් අමාත්‍යවරු සහ අනෙකුත් ප්‍රභූවරුන් නැවත නැවතත් සංචාරයේ නිරත වූ අවස්ථා කිහිපයක් ඇත. යම් අවස්ථාවන්හි දී, එකම අරමුණක් වෙනුවෙන් වාර ගණනාවක් සිදු කරන මෙවැනි සංචාර හේතුවෙන් අදාළ විදෙස් රාජ්‍යයන් විසින් එහි තාර්කිකත්වය සහ එවැන්නක අවශ්‍යතාව විමසීමට පෙළඹී ඇත. තවද, ප්‍රමාණවත් පූර්ව දැනුම් දීමකින් තොරව දූත මණ්ඩල පහසුකම් ලබා ගැනීම සඳහා සිදු කරන මෙවැනි ඉල්ලීම් හේතුවෙන්, විශේෂයෙන්ම වර්තමාන වාතාවරණය යටතේ සීමිත කාර්ය මණ්ඩලයක් සහ සම්පත් සහිතව ක්‍රියාත්මක වන්නා වූ ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල අතිශය දුෂ්කර තත්ත්වයකට පත්වන අතරම ප්‍රතිඵල ප්‍රමාද වීමටද තුඩු දෙනු ඇත.

ගරු අමාත්‍යවරු, ගරු රාජ්‍ය/ නියෝජ්‍ය අමාත්‍යවරු නිරත වන විදේශ සංචාර පිළිබඳව අදාල ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල දැනුවත් කර නොමැති යම් අවස්ථා අවධානයට ලක් වී ඇත. මෙය අනවශ්‍ය තත්ත්වයන්ට තුඩු දිය හැකි අතර දූත මණ්ඩලය, ඔවුන්ට අවශ්‍ය හදිසි සහාය ලබා දීමට හැකි තත්ත්වයක නොසිටිය හැකි ය.

ඇතැම් අමාත්‍යාංශ විසින්, එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලින් සහ යම් අවස්ථාන්හි දී විදෙස් රජයන්හි අස්ථිත්වයන්ගෙන් එම රටවල නිල/ නිල නොවන සංචාරයේ නිරත වන ශ්‍රී ලංකාවේ අති විශේෂ ප්‍රභූවරුන් සඳහා පහසුකම් සහ පිළියෙළ කිරීම් සිදු කරන මෙන් සෘජු ඉල්ලීම් සිදු කර ඇති බව අවධානයට ලක් වී ඇත. මෙම පරිචය, පරිපාලනමය සහ සන්ධාන පැතිකඩින් මෙන්ම විදේශ සබඳතා සම්බන්ධයෙන් පවත්නා දෘෂ්ටිකෝණයෙන් නුසුදුසු වන්නකි. විදේශ සංචාර සඳහා සිදු කරනු ලබන සියලුම ඉල්ලීම් ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් පමණක් යොමු කළ යුතු ය. හදිසි අවස්ථාවල දී හැර, යොමු කරනු ලබන සෘජු ඉල්ලීම් ඉටු කිරීමෙන් වැළකී සිටිය යුතු අතර එම ඉල්ලීම් ද විදේශ කටයුතු අමාත්‍යාංශයේ උපදෙස් ඇතිව පමණක් සිදු කළ යුතු බවට එතෙර පිහිටි ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවලට දන්වා ඇත.

අප්‍රසන්න සිදුවීම් වැළැක්වීම උදෙසා, සියලුම සංචාර සඳහා සිදු කරන ඉල්ලීම් නිසි පරිදි සහ කලින් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන අතර එබැවින්, විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් යොමු කළ යුතු ය. විදේශ සබඳතා පිළිබඳ ඇඟවුම් අවධානයට ගනිමින් මෙම ඉල්ලීම් විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් යොමු කෙරෙන අතර ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ එතෙර පිහිටි දූත මණ්ඩල දැනුවත් කරනු ලැබේ. බොහෝ රටවල අමාත්‍ය සහ ඉහළ මට්ටමේ හමුවීම් සම්බන්ධීකරණ ක්‍රියාවලිය සඳහා ඔවුන්ට ප්‍රමාණවත් ඉදිරි කාලයක් අවශ්‍ය වේ.

අදාළ විදේශ සංචාර සඳහා ගරු ජනාධිපතිතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට ද පියවර ගත යුතු ය.

තවද, අමාත්‍යවරයෙකු/ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විසින් විදෙස් සාකච්ඡා අතරතුර දී ශ්‍රී ලංකාවේ සංචාරයක් සඳහා විදේශ ප්‍රභූවරයෙකුට ආරාධනා කිරීමට පෙර විදේශ කටයුතු අමාත්‍යාංශයේ පූර්ව එකඟතාව ලබා ගත යුතු ය. මෙය, අදාළ ප්‍රභූවරයා අයත් රාජ්‍යය සමඟ ශ්‍රී ලංකාව ගෙන යනු ලබන සබඳතාව සහ අදාළ කාලයේ දී ශ්‍රී ලංකාව අනුගමනය කරනු ලබන සමස්ථ විදේශ ප්‍රතිපත්ති සන්දර්භය තුළ එවැනි සංචාරයක් යෝග්‍ය දැයි මූලිකව නිශ්චය කිරීම සඳහා අවශ්‍ය ය. පවතින සීමිත

සම්පත් හේතුවෙන් එවැනි සංචාරයකින් ශ්‍රී ලංකාවට හිමි විය හැකි ප්‍රතිලාභ මෙන්ම එකී සංචාර සිදු විය යුතු නිසි කාලය සැලකීමට ගත යුතු කරුණු වේ.

8. වීසා

නිල සහ පෞද්ගලික සංචාර සඳහා වීසා ලබා ගැනීම සඳහා සහ/ හෝ මෙම වීසා අයදුම්පත්‍ර සඳහා සහාය ලබා ගැනීමටත් විදේශ කටයුතු අමාත්‍යාංශයට සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට ඉල්ලීම් ගණනාවක් ලැබේ.

නිල තනතුරු දරන පුද්ගලයන්ට ද ඇතුළුව පෞද්ගලික සංචාර සඳහා වීසා පහසුකම් සැලසීමේ කිසිදු අධිකාරයක් විදේශ කටයුතු අමාත්‍යාංශයට නොමැත. කිසිදු රජයේ ආයතනයක් විසින් පෞද්ගලික සංචාර සඳහා වීසා අයදුම්පත්වලට සහාය දක්වමින් රාජකාරි ලිපි නිකුත් නොකළ යුතු ය. අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු හෝ රජයේ නිලධාරින් විසින් නිරත වීමට අපේක්ෂිත සංචාරය නිල ස්වභාවයේ සංචාරයක් නම්, එම සංචාරයට නියමිත දිනට අවම වශයෙන් සති හතරකට පෙර ඒ සම්බන්ධ තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතු ය. එවැනි සංචාරයක් සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිෂ්කාශනය ලැබී ඇත්නම්, විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් රාජකාරි අරමුණ වෙනුවෙන් වීසා ලබා ගැනීම සඳහා සිදු කරන ඉල්ලීමට සහාය දක්වමින් තෙවන පාර්ශවීය ලිපියක් (Third Person Note) නිකුත් කරනු ලැබේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වීසා ලබා ගැනීම සඳහා සහාය ලබා ගැනීමට යොමු කරන ඉල්ලීම පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ යුතු ය.

එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයක් මඟින් නිල සංචාර සඳහා වීසා ලබා ගැනීමට අවශ්‍ය කෙරෙන අවස්ථාවේ දී, සංචාරයේ යෙදීමට අදහස් කරනු ලබන දිනට අවම වශයෙන් සති තුනකට පෙර එවැනි ඉල්ලීම් යොමු කළ යුතු ය.

විමසීම්: චාරිකා අංශය (Travel Unit), විදේශ කටයුතු අමාත්‍යාංශය
දුරකථන: 011 2423900/ 0112 2328753
විද්‍යුත් තැපැල: dgoamd@mfa.gov.lk, travel@mfa.gov.lk

9. රාජ්‍යතාන්ත්‍රික උත්සව සඳහා සහභාගි වීම

විදෙස් රාජ්‍යයක ජාතික දින උත්සවයන්හි දී රජය නියෝජනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් සෑම මසකම හෝ උත්සව පදනමින් අමාත්‍යවරයෙකු නම් කිරීම තීරණය කරයි. එවැනි නම් කිරීමක් සිදු කරන විට, සුදුසු මට්ටමින් ජාතික දින උත්සවයේ දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම අවශ්‍ය වන බැවින් නම් කරන ලද අමාත්‍යවරයාගේ පෞද්ගලික සහභාගිත්වය තහවුරු කිරීම අවශ්‍ය වේ. නම් කරන ලද අමාත්‍යවරයාගේ පැමිණීම සම්බන්ධයෙන් යම් දුෂ්කරතාවක් ඇති වූ අවස්ථාවක දී, විකල්ප වැඩපිළිවෙළක් සලසා ගැනීම සඳහා අවම වශයෙන් සති දෙකකට පෙර හෝ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සන්ධාන අංශය දැනුවත් කළ යුතු ය.

එම අවස්ථාවන්හි දී ඉදිරිපත් කිරීමට නියමිත කෙටි ප්‍රකාශනයක් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සකස් කර අදාළ අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබේ.

ජාතික උත්සව පිළිබඳ සඳහන් වන මාසික කාලටහනක් ද අදාළ අමාත්‍යවරයාට ඉදිරිපත් කරනු ලැබේ.

විමසීම්: සන්ධාන අංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය
දුරකථන: 0112 421816/ 011 2327048
විද්‍යුත් තැපැල: cprot@mfa.gov.lk, protocol@mfa.gov.lk

රාජ්‍යතාන්ත්‍රික උත්සවවලදී, අමාත්‍යාංශ/ නියෝජිතායතනවලින් ඕනෑම නියෝජනයක්/ සහභාගි වීමක් අධ්‍යක්ෂ හෝ ඉහළ මට්ටමෙන් සිදු වීම අවශ්‍ය වේ.

මෙම රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය .... චක්‍රලේඛය
ලිපිය .... දින සිට
ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය 2023.03.13

10. රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවලින් ලැබෙන ආරාධනා

තානාපති/ මහ කොමසාරිස් හෝ දූත මණ්ඩල ප්‍රධානී යන තනතුරුවලට පහළ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවලින් උත්සව සහ දිවා/ රාත්‍රී භෝජන සංග්‍රහ සඳහා ලැබෙන ආරාධනා අමාත්‍යවරු විසින් පිළිනොගන්නා බවට සහතික වීම වැදගත් ය. මෙය, ස්වෛරී සහ සත්කාරක රාජ්‍යක් වශයෙන් ශ්‍රී ලංකාවට ලැබිය යුතු තත්ත්වය සුරැකීම සඳහා අඛණ්ඩව පවත්වාගෙන යාම වැදගත් වන්නා වූ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සන්ධානයට අනුගත වෙමින් සිදු වන්නකි.

ශ්‍රී ලංකාවේ පිහිටි රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/ නිලයන් විසින් සිය රජයන්, සංවිධාන හෝ ආයතන වෙනුවෙන් ගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය, ගරු අමාත්‍යවරු, ගරු ආණ්ඩුකාරවරු, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, සහ මධ්‍යම/ පළාත්/ පළාත් පාලන රජයන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා සම්මේලන හෝ වෙනත් යම් අරමුණක් සඳහා එම රටවල අමුත්තන් වශයෙන් සහභාගි වීම සඳහා සිදු කරනු ලබන කිසිදු ආරාධනයක් විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව නොමැතිව පිළිනොගත යුතු ය.

11. ජාත්‍යන්තර/ ප්‍රාදේශීය සම්මේලන, සමුළු ආදිය වෙනුවෙන් සත්කාරක සේවා සැපයීම

ජාත්‍යන්තර/ ප්‍රාදේශීය සම්මේලන, සමුළු ආදිය සම්බන්ධයෙන් සත්කාරක සේවා සැපයීම සම්බන්ධයෙන් පවතින ක්‍රියාවලිය යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ. විදෙස් රාජ්‍යයක් හෝ සංවිධානයක් වෙනුවෙන් එවැනි උත්සව අවස්ථාවකට සත්කාරක සේවා සැපයීම සඳහා බැඳීමට පෙරාතුව විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව ලබා ගත යුතු ය. සම්මේලනයේ හෝ සමුළුවේ පරමාර්ථ, එමඟින් ශ්‍රී ලංකාවට අත්කර ගැනීමට බලාපොරොත්තු වන්නා වූ ප්‍රතිඵල සහ වාසි, සත්කාරක සේවා සඳහා වන මූල්‍ය වියදම්, සහභාගි වන්නා වූ රාජ්‍යයන්/ සංවිධානවල ලැයිස්තුව, වීසා ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම සහ සන්ධාන සහාය වැනි විදේශ කටයුතු අමාත්‍යාංශය වෙතින් ලබා දීමට අවශ්‍ය කෙරෙන යම් සහාය ආදිය පිළිබඳව එකඟතාව ලබා ගැනීම සඳහා යොමු කරනු ලබන ඉල්ලීමෙහි කෙටියෙන් සඳහන් කළ යුතු ය. සත්කාරක සේවා ලබා දීම සඳහා ඉදිරිපත් වීමට පෙර, විදේශ කටයුතු අමාත්‍යාංශයට එතෙර පිහිටි අදාළ විදේශ දූත මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය වී නිශ්චිත තීරණයකට එළැඹීමට හැකි වනු පිණිස එවැනි ඉල්ලීම් අවම වශයෙන් මාසයකට පෙර එම අමාත්‍යාංශයට යොමු කළ යුතු ය.

12. ශ්‍රී ලංකාවේ සංචාරයේ නිරත වන විදෙස් ප්‍රභූවරුන් සඳහා වැඩසටහන්

කොළඹ නේවාසිකව සිටින තානාපතිවරු/ දූත මණ්ඩල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ රටවල් වලින් මෙරට සංචාරයේ නිරතවන ප්‍රභූවරුන්ට ශ්‍රී ලංකාවේ අමාත්‍යවරු/ ප්‍රභූවරු සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවීම සඳහා සෘජුව වේලාවන් වෙන්කර ගැනීම සිදු කරන ආකාරය අවධානයට ලක්ව ඇත. මෙය, පිළිගත් රාජ්‍යතාන්ත්‍රික පරිචයට සහ ක්‍රියා පරිපාටියට පටහැනි ය. තානාපතිවරු/ දූත මණ්ඩල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ රටවලින් සංචාරයේ නිරත වන ප්‍රභූවරුන් සඳහා අවශ්‍ය කෙරෙන වැඩසටහන් සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ සන්ධාන අංශයට ප්‍රථමයෙන් දැනුම් දිය යුතු අතර සන්ධාන අංශය විසින් මෙරට බලධාරීන්ගෙන් ඒ සඳහා සුදුසු වේලාවන් වෙන්කර ගැනීමට කටයුතු කරනු ඇත. එම පරිචය පළාත් අමාත්‍යවරු සහ ආණ්ඩුකාරවරු විසින් ද අනුගමනය කළ යුතු ය. එලෙසම, ශ්‍රී ලංකාවේ පළාත් අමාත්‍යවරු හෝ ආණ්ඩුකාරවරු සෘජුව මුණ ගැසීම සඳහා ශ්‍රී ලංකාවේ නේවාසික තානාපතිවරු/ දූත මණ්ඩල ප්‍රධානීන් විසින් ඔවුන් හෝ එම දූත මණ්ඩල කාර්ය මණ්ඩල වෙනුවෙන් අපේක්ෂා කරනු ලබන වේලා වෙන්කර ගැනීම් සන්ධාන අංශයට යොමු කළ යුතු අතර ඒ සඳහා එකඟතාව ලබා ගත යුතු වේ.

13. සංචාරයේ නිරත විදෙස් ප්‍රභූවරුන් සමඟ හමුවීම්

සංචාරයේ නිරත ප්‍රභූවරුන් හෝ කොළඹ නේවාසිකව සිටින තානාපතිවරු/ දූත මණ්ඩල ප්‍රධානීන් විසින් ගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය හෝ ගරු අමාත්‍යවරු මුණ ගැසීමේ දී, එවැනි හමුවීම් සඳහා සුදුසු නියම තරාතිරම සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගැනීම අපේක්ෂා කෙරේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය ද ඇතුළුව තානාපති කාර්යාලවල පහළ මට්ටමේ තනතුරු හොබවන නිලධාරීන්ට සහ සංචාරයේ නිරත විදෙස් දූත මණ්ඩලවලට ගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය හෝ ගරු අමාත්‍යවරු මුණ ගැසීම සඳහා පහසුකම් සැලසීම සිදු නොකළ යුතුය.

විමසීම්: සන්ධාන අංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය
දුරකථන: 0112 421816/ 011 2327048
විද්‍යුත් තැපැල: cprot@mfa.gov.lk, protocol@mfa.gov.lk

14. ශ්‍රී ලංකාවෙන් සංචාරයේ නිරත වන ප්‍රභූවරු සහ ජ්‍යෂ්ඨ නිලධාරීන් සඳහා එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් ලබාදිය යුතු පහසුකම්

විදේශ කටයුතු අමාත්‍යාංශයට මෙන්ම එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට රාජකාරි හෝ පෞද්ගලික සංචාර සඳහා ශ්‍රී ලංකාවෙන් සංචාරයේ නිරත වන ගරු අමාත්‍යවරුන්ගෙන්, ගරු රාජ්‍ය/ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගෙන්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සහ ජ්‍යෂ්ඨ නිලධාරීන්ගෙන් ඔවුන්ට ගුවන් තොටුපොළට පැමිණීමට, අතුරු වාරිකාවට (transit), පිටත් වීමට සහ ගුවන් තොටුපළෙහි වැදගත් පුද්ගලයන් සඳහා වෙන්කර ඇති විවේකාගාරයේ රැඳී සිටීමට, නවාතැන් සහ ප්‍රවාහන පහසුකම් ආදිය පිළියෙළ කිරීම සිදු කර ගැනීම සම්බන්ධයෙන් නිරන්තරයෙන් ඉල්ලීම් ලැබේ.

විදෙස් රජයන් විසින් ගුවන් තොටුපළෙහි වැදගත් පුද්ගලයන් සඳහා වෙන්කර ඇති විවේකාගාර පහසුකම, විශේෂ අවස්ථාවන්හි දී හැර, සපයනු ලබන්නේ ගෙවීම් පදනමින් බව සඳහන් කළ යුතු ය. එබැවින්, මෙම පහසුකම නොමිලේ ලබා දීමේ හැකියාවක් එතෙර පිහිටි විදේශ දූත මණ්ඩල සතු නොවේ. මෙම සන්දර්භය තුළ, ගුවන් තොටුපළෙහි වැදගත් පුද්ගලයන් සඳහා වෙන්කර ඇති විවේකාගාර පහසුකම ලබා ගැනීමට අපේක්ෂා කරන අදාළ අමාත්‍යවරයා/ ප්‍රභූවරයා/ නිලධාරීන් අයත් රේඛීය අමාත්‍යාංශය/ ආයතනය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා එතෙර පිහිටි විදේශ දූත මණ්ඩලයට එම අදාළ ගෙවීම් පූර්වයෙන් සිදු කළ යුතු ය.

ශ්‍රී ලංකාව සතු නේවාසික දූත මණ්ඩලයක් පවතින කල්හි, එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් සංචාරයේ නිරත ප්‍රභූවරුන් සඳහා සන්ධාන සහාය සහ ගුවන් තොටුපළේ සිට හෝටලය දක්වාත්, හෝටලයේ සිට ගුවන් තොටුපළ දක්වාත් ප්‍රවාහන පහසුකම් පිළියෙළ කරනු ලබන්නේ රාජකාරි අරමුණු සඳහා පමණි. පවත්නා මාර්ගෝපදේශයන්ට අනුකූලව, පෞද්ගලික සංචාර සඳහා සන්ධාන සහාය ලබා දෙනු ලබන්නේ ගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය, ගරු කථානායක, ගරු අගවිනිසුරු, ගරු විපක්ෂ නායක සහ ගරු කැබිනට් අමාත්‍යවරු සඳහා පමණි.

තවද, පවත්නා චක්‍රලේඛයන්ට අනුව, ගරු කථානායක, ගරු අගවිනිසුරු, ගරු විපක්ෂ නායක සහ ගරු කැබිනට් අමාත්‍යවරුන්ගේ පෞද්ගලික සංචාර සඳහා ගුවන් තොටුපළේ සිට හෝටලය දක්වාත්, හෝටලයේ සිට ගුවන් තොටුපළ දක්වාත් දූත මණ්ඩලය විසින් ප්‍රවාහන පහසුකම් සඳහා අවශ්‍ය කටයුතු සලසනු ලබන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ උපදෙස් මත ය. එබැවින්, විදේශ කටයුතු අමාත්‍යාංශයට එවැනි සංචාර පිළිබඳ නිසි වේලාවට දැනුම් දිය යුතු ය. විදේශ කටයුතු අමාත්‍යාංශය හෝ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලය විසින් අනෙකුත් අදාළ වියදම් කිසිවක් දරනු නොලැබේ. දූත මණ්ඩල විසින් ගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය සහ ගරු විදේශ අමාත්‍ය වෙනුවෙන් වෙනත් ආකාරයේ විධිවිධාන සලසනු ඇත.

ඒ අනුව, අදාළ අමාත්‍යාංශ/ ආයතන විසින් එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණයෙන් අනෙකුත් කටයුතු සඳහා විකල්ප ප්‍රවාහන ක්‍රම සැලසිය යුතු අතර රේඛීය අමාත්‍යාංශය/ ආයතනය විසින් එම වියදම් දැරිය යුතු ය.

නවාතැන්, දුරකථන, ප්‍රවාහන, එසවුම් කුලී ආදිය සඳහා වූ කිසිදු බිල්පතක් ගෙවීමට සහ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිශ්චිතව උපදෙස් ලබා නොදෙන්නේ නම් අත්තිකාරම් මුදල් ලබා දීමට දූත මණ්ඩලය බලාපොරොත්තු නොවේ. මේ සම්බන්ධයෙන් කිසිදු අවස්ථානුකූල කරුණක් යටතේ ව්‍යතිරේක නොතිබිය යුතු ය. ගරු අමාත්‍ය, ගරු රාජ්‍ය අමාත්‍ය, අමාත්‍යාංශය, ආයතනය ආදියේ ඉල්ලීම මත නිල සංචාර සූදානම් කරන විට, එම ඉල්ලීම සිදු කරනු ලබන රේඛීය අමාත්‍යාංශය/ ආයතනය විසින් එම සංචාර සඳහා අදාළ වන සියලුම වියදම් දැරිය යුතු ය.

15. චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කිරීම අධීක්ෂණය

මෙම චක්‍රලේඛයට අනුගත වීම අධීක්ෂණය සඳහා පහත සාමාජිකයන්ගෙන් සමන්විත ඉහළ මට්ටමේ කමිටුවක් පිහිටුවනු ලැබේ.

- ගරු විදේශ කටයුතු අමාත්‍ය
- ජනාධිපති ලේකම්
- අමාත්‍ය මණ්ඩල ලේකම්
- ලේකම්/ විදේශ කටයුතු අමාත්‍යාංශය
- ලේකම්/ රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

කමිටු රැස්වීම්, අවශ්‍ය විට, කැඳවනු ලබන අතර නිලධාරින්ට හෝ පුද්ගලයන්ට සුදුසු පරිදි රැස්වීම් සඳහා සහභාගී වීමට ආරාධනා කෙරේ. මෙම චක්‍රලේඛයේ සඳහන් මාර්ගෝපදේශයන්ට අනුගත වීමේ තත්ත්වය පිළිබඳ මෙම කමිටුව විසින් අවශ්‍ය පරිදි, වාචිකව හෝ ලිඛිතව අදාළ අමාත්‍යාංශ සහ අනෙකුත් රජයේ ආයතනවල අවධානයට යොමු කෙරෙනු ඇත.

මෙම චක්‍රලේඛ විධිවිධානවලට අනුගත වීම සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය බෙහෙවින් අගය කරමි.

අත්.කළේ/ ඊ එම් එස් බී ඒකනායක
ජනාධිපති ලේකම්
දුරකථන: + 94 11 2354420 ෆැක්ස්: + 94 11 2446657
විද්‍යුත් තැපැල: prsec@presidentsoffice.lk

පිටපත්
1. ගරු නීතිපති
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩයේ ලේකම්
4. මහ බැංකුවේ අධිපති
5. මැතිවරණ කොමසාරිස් ජනරාල්
6. විගණකාධිපති
7. පාර්ලිමේන්තුවේ මහ ලේකම්
8. ශ්‍රේෂ්ඨාධිකරණ ලේඛකාධිකාරි
9. පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්
10. ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක ලේකම්

මෙම රාජ්‍ය පරිපාලන/රාජ්‍ය .... /
ජනාධිපති .... චක්‍රලේඛය / උපදෙස්
ලිපිය .... දින සිට
දැනුම් [illegible] අදාල කර ගැනීම සඳහා
ගරු [illegible] 2023 - 03 - 13
දින ලබා දී ඇති බව සහතික කරමි.
....
ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් / [illegible]